# Path to Success – Study Pack

## තෙවන වාරය සඳහා ඉගෙනුම් අත්වැල

# නර්තනය
# 6 ශ්‍රේණිය



අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය

**උපදේශනය හා අධීක්ෂණය**
පී.ඩී. ඉරෝෂිනි කේ. පරණගම මිය - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

**මෙහෙයවීම හා සංවිධානය**
ඒෆ්. ඒච්. ජේ. පී. සිල්වා මයා -නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ( සංවර්ධන )

**විෂය සම්බන්ධීකරණය**
අමිතා ඉන්දිරානි - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය)

**සම්පත් දායකත්වය**
අනෝමා කහඳවආරච්චි - ගුරු උපදේශක

**සියලු හිමිකම් ඇවිරිණි**

## “ලී කෙළි නැටුමක් නිර්මාණය කරමු .”

- **පහත සුවිශේෂ ලක්ෂණ දැක්වෙන ගැමි නැටුම තෝරා ගන්න.**
- **එම ගැමි නැටුමට අදාළ කවි පද ඇතුලත් පිලිතුර තෝරා යා කරන්න.**

| |
|---|
| සුවිශේෂ ලක්ෂණ :- ජවය ,සාමූහික බව,විනෝදාස්වාදය,රංග උපකරණ භාවිතය ලී දගය සහිත මල්ලිය. |

- **යා කරන්න.**

| | |
|---|---|
| එක පදුරෙන් ලී | අගනෝ සැරසීලා |
| අහසට පිඹිනා | තරු සිටියා |
| බෝ අත්තට වැද | සයක් කපාගෙන |
| ඉරට ඔබිය ඉර වට | පටි ගෙන්නාලා |
| රටලින් ඇරලා | සිරස නමන්නේ |
| පේළි සැදි | එරන් කලේයා |

**පැවරුම:-**

- ඔබ දැක ඇති ලී කෙළි නැටුමක් උපයෝගී කරගනිමින් ලී කෙළි නැටුමට උචිත චලනයක් (ලී දෙක සහිතව) නිර්මාණය කරන්න.

## “නර්තනයේදි සිරුර කෙසේ හසුරුවන්නේදැයි විමසමු.”

- ශරීරයේ ප්‍රධාන අංග ලෙස හිස,අත්,ඉගටිය,පපුව,දෙපා,බඳ,දැක්වීය හැකිය .
- අත් හා පාද චලනයේදී නැමීම,දිග ඇරීම,ඇඟිලි වලින් කරනු ලබන චලන,හිස නැමීම දිග ඇරීම,මුහුණෙන් ඉදිරිය බැලීම,ඉන ගැනීම,පැනීම,උඩ පැනීම,ශරීරයේ විශාල කොටස් ම මෙන්ම කුඩා කොටස් ද භාවිතයට ගැනීම සිදු වෙයි.
- මෙම ක්‍රියාකාරකම් සඳහා උපයෝගී වන ශරීරයේ කොටස් **අංග, ප්‍රත්‍යාංග, උපාංග** ලෙස හැඳින්විය හැකිය.

- **පහත දැක්වෙන ශරීරයේ කොටස් අංග, , ප්‍රත්‍යාංග ,උපාංග ,වශයෙන් වෙන් කොට දක්වන්න.**

| |
|---|
| **හිස,වැලමිට,කඳ,අත්,පාද,ඇඟිලි,ඇහි බැම,බෙල්ල,තොල්,දණහිස,ඇස් බෝලය.** |

| අංග | ප්‍රත්‍යාංග | උපාංග |
|---|---|---|
| | | |

**පැවරුම:-**

- ගීත අනුව නර්තනයක් නරඹා එම නර්තන නිර්මාණයේදි අංග , ප්‍රත්‍යාංග, උපාංග හසුරුවන අයුරු විස්තරයක් ලියන්න.

## "වන්නම් ගයමින් නටමු."

- **හිස් තැනට අදාල වචනය පහත කොටුවෙන් තෝරා ලියන්න.**

❖ **හනුමා වන්නම**

**තිත:-** මත්‍රා 2තනි තිත (සුලු තනි තිත )

**තාල රූපය:-** 1 2/1 2/1 2/

**බෙර පදය:-** කුද ගත ............ දොං

**තානම:-** තනම් දනත්.................දනත් තනම් දන

තනම් දනත් ........................තෙයි

තනම් දනත් තම් දනත්

තනම් දන තනම් දනත් තනෙනා

**කවිය :-** ගිරෙන් ගිරට ........................ලැගුම් සොයා පුබුදමින්

අරුණ කළ මා-ගොර

දෙමින් නැවත වට පිටින් .....................නෙක

උසුලු විසුලු පුදුමා

එයින් නැවත පලතුරින් ..........................පැන

මලින් පලද දලු මා-අත

දෙමින් ...................කට කොනින් බුදිති වට

පිටින් බියැති බැලුමා

දුටින් අයෙක් සටපටින් පැනුම් රැළි

…………………........ නෙරා සෙව්මා-බය

දුටින් එවිට අතුපතින් වසා මුව

ඉතින් නැතෙයි පෙනුමා

……………….උඩගු සිත ගතින් වැඩිව පෙර

පැතුම් විලස දැරුමා-නැණ

යකින් මෙලෙස ඉසිමතින් යෙදුව පෙර

මෙවන් වරුන ……………………………………

කස්තිරම:- රුංතක ජිංතක තරිකිට කුංදත්

තාග්ග ජිංතක තරිකට කුංදත්

රුංතක ජිංතක තරිකිට කුංදත් තා

| |
|---|
| **ගත,පැන ,තම්,බලති ,රැගෙන ,තනෙනා ,පොටින්,මතින් ,හනුමා තුරට** |

**“වාදනයෙන් ශබ්ද හා නාද නිපදවමු.”**

- **පහත සදහන් භාණ්ඩ, වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය භණ්ඩ ලෙස වගු ගත කරන්න.**

| වාද්‍ය භාණ්ඩ | විකල්ප වාද්‍ය භාණ්ඩ |
|---|---|
| | |

| |
|---|
| **ටින් බෙරය, ප්ලාස්ටික් බෙරය , එක්ස් රේ බෙරය , ගැටබෙරය, පහතරට බෙරය, පොල් කොල නළාව, දවිල,තම්මැට්ටම, වල් වචළල්ල , බැලුන් පටලය, උඩැක්කිය, පැපොල්බට නළාව, අත් රබාන , තාලම්පොට** |

- **දුම්රිය හඬ තේමා කර ගනිමින් වාදන නිර්මාණයක් කිරීමට යොදා ගත හැකි සාම්ප්‍රදායික භාණ්ඩ හා විකල්ප වාද්‍ය භාණ්ඩ ලැයිස්තු ගත කරන්න.**
- **දුම්රිය හඬ උපදවා ගත හැකි පද කිහිපයක් නිර්මාණය කරන්න.**

## නර්තනයේ ප්‍රවර්ධනයට දායක වුවන් අගයමු.

**නිත්තවෙල ගුණයා මහතා:-**

- නිත්තවෙල ගුණයා ගුරුතුමා 1906 දී උපත ලැබීම.
- උඩරට නර්තන සම්ප්‍රදායේ නර්තන ශිල්පියෙකි.
- එතුමා සාම්ප්‍රදායික උඩරට නර්තනය ප්‍රාසාංගික වේදිකාවට සුදුසු ලෙස සකස් කිරීම.
- ජාත්‍යන්තර තලයට උඩරට නර්තනය ගෙන යාමට කටයුතු කිරීම.
- වන්නම් 18 ට අමතරව සමනල වන්නම නිර්මාණය කිරීම.
- 1950 වසරේ දී එතුමාගේ රුව ඇතුළත් තැපැල් මුද්දරයක් නිකුත් කිරීම.

**එන්.ඒ. සිරිබෝභාමි මහතා:-**

- මෙතුමා සබරගමුවේ පැල්මඩුල්ල, සන්නස්ගම ජීවත් වූවෙකි.
- සබරගමු සම්ප්‍රදායේ නර්තන ශිල්පියෙකි.
- සබරගමු මඩු සම්ප්‍රදායයේ, දවුල් වාදනයට හා ගායනයට අති දක්ෂ ඇදුරු තුමෙකි.
- කලායතනයක් පවත්වා ගෙන යමින් සියලු දරුවන්ට සබරගමු නර්තනය පිළිබඳ දැනුම හා ප්‍රායෝගික කුසලතාවයන් ලබා දුන්හ.
- සබරගමු නර්තන සම්ප්‍රදාය පාසල් පද්ධතියට ඇතුළු කිරීමට පවා පුරෝගාමී විය.
- ශාන්තිකර්මවලට සීමා වී තිබූ සබරගමු නර්තන කලාවට කලඑළියක් ලබාදීමට කටයුතු කිරීම.
- සබරගමු නැටුම උගතුන්ගේ හා විචාරකයන්ගේ අවධානයට යොමු කිරීමට සුවිශාල මෙහෙයක් ඉටු කිරීම.
- රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස කටයුතු කිරීම.
- උසස් අධ්‍යාපනය සඳහා සබරගමු නර්තන සම්ප්‍රදාය ප්‍රවර්ධනයට මහත් උත්සාහයක් ගැනීම.
- සබරගමු නර්තනය අද ප්‍රාසාංගික වේදිකාවේ පවා අත්‍යවශ්‍ය අංගයක් වී තිබීමේ ගෞරවය හිමි වීම.

**එස්.එච්.සව්රිස් සිල්වා මහතා:-**

- සුවඳ හැන්නැදිගේ සව්රිස් සිල්වා මහතාගේ උපන් ගම තංගල්ල යි.
- 1896 වංශයේ උපත ලැබීම.
- පහතරට නැටුම් පිළිබඳ දක්ෂ නර්තන ශිල්පියෙකි,ප්‍රවීන ගුරුවරයෙකි.
- පහතරට නර්තන කලාව ප්‍රචලිත කිරීමටත්,ප්‍රාසාංගික කලාවක් ලෙස නූතන වේදිකාවට ගෙන ඒමට කටයුතු කිරීම.
- රජයේ කලායතනයෙහි බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස කටයුතු කිරීම.

- 1948 දී ජයන්ති කලායතනය බිහිකිරීම.
- 1958 දී දෙවන එලිසබෙත් රැජින ලක් දිවට පැමිණි අවස්ථාවේ පැවැත් වූ ප්‍රසංගයේ ප්‍රධාන නර්තන ශිල්පියා වීම.

**මෙතුමාගේ කෘති:-**

- 1965:- පහතරට නැටුම් (පහතරට නැටුම් පිළිබඳ ප්‍රථම සිංහල ග්‍රන්ථය)
- 1971:- සූනියම් ශාන්තිය
- 1982 දී අභාවප්‍රාප්ත වීම.
- මෙතුමාගේ නර්තන රංග වස්ත්‍රාභරණ කට්ටලය දැනට ජාතික කෞතුකාගාරයේ තැන්පත් කොට තිබීම.

- **දී ඇති සටහන උපයෝගී කරගනිමින් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.**

| | නිත්තවෙල ගුණයා මහතා | එන් සිරිබෝහාමි මහතා.ඒ. | එස් සච්රිස් සිල්වා මහතා.එච්. |
|---|---|---|---|
| අයත් සම්ප්‍රදාය | | | |
| ශිල්පීය දක්ෂතාව | | | |
| නර්තන කලාවට සිදු වූ සේවාව | | | |
| නිර්මාණය කරන ලද කලා කෘති | | | |

## සමන් දේවාල පෙරහර අසිරිය පවසමු.

**මහ සමන් දේවාල පෙරහැර:-**

- මහ සමන් දේවාලය පිහිටා ඇත්තේ රත්නපුර නගරයට නුදුරින් දේවාලේගම නම් ග්‍රාමයේ ය.
- දඹදෙණියේ රජකළ දෙවැනි පැරකුම්බා රජුගේ ඇමති වරයකු වන "ආර්ය කාමදේව" නැමැත්තා විසින් ක්‍රි:ව:1228 දී පමණ මෙම දේවාලය කරවන ලද බව පැවසේ.
- පෘතුගීසි ආක්‍රමණවලින් පසුව මෙම දේවාලය ප්‍රතිසංස්කරණය කරන ලද්දේ දෙවන රාජසිංහ රජු විසිනි.

- වාර්ෂික චාරිත්‍ර අතර ප්‍රමුඛස්ථානයක් ගනු ලබන්නේ ඇසළ පෙරහර මංගල්‍යය අගෝස්තු මාසයේ පවත්වනු ලබයි.

**සමන් දේවාල දේවාල පෙරහැර හා බැදි චාරිත්‍ර:-**

මෙම චාරිත්‍ර ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදා දැක්වේ.

1. දින පතා පවත්වන චාරිත්‍ර
2. සතිපතා පවත්වන චාරිත්‍ර
3. වාර්ෂිකව පවත්වන චාරිත්‍ර

**දිනපතා පවත්වන චාරිත්‍ර:-**

1. අළුයම් ධුරයේ තේවාව
2. හිල්ම තේවාව
3. මහ තේවාව(දහවල්)
4. බොලපැන් තේවාව
5. හැන්දාදුරයේ තේවාව
6. මහ තේවාව(රාත්‍රී කාලය)

**සතිපතා පවත්වන චාරිත්‍ර:-**

1. බදාදා හා සෙනසුරාදා පවත්වන පූජා

**වාර්ෂික පූජා:-**

1. අලුත් සහල් මංගල්‍යය
2. අලුත් අවුරුදු උත්සවය
3. ඉල්මහ  කාර්තික  උත්සවය
4. ඇසල පෙරහැර උත්සවය

- **වීදී පෙරහර හෙවත් දෙවේලේ පෙරහැර ගමන් කරන සමන් දේවාල භූමියේ වීදී පහ ලෙස,**

1. උඩ වීදිය
2. කුඹල් වීදිය
3. ගම්පහ වීදිය
4. හුණුවල වීදිය
5. සංහිදේ විදිය ලෙස හැඳින්වේ.

- **සමන් දේවාල පෙරහැර, පෙරහැර පහකින් සමන්විත ය.**

1. දළදා පෙරහැර
2. පත්තිනි පෙරහැර
3. බිසෝ පෙරහැර
4. කුමාර පෙරහැර
5. සමන් දෙවි රජ පෙරහැර යනුවෙනි.

- **පෙරහැරේ දැකිය හැකි නර්තන අංග:-**

1. තෙල්මේ
2. සබරගමු නර්තනයේ මාත්‍රා පහේ නැටුම
3. උඩරට වෙස් නැටුම්
4. පන්තේරු හා උඩැක්කි නර්තනකණ්ඩායම්
5. විවිධ නැටුම්
6. පහතරට තෙල්මෙ
7. දෙවොල්
8. වඩිග පටුන ආදී නර්තන අංග
9. ද්‍රවිඩ ගැමි නැටුම් ආදිය…..

- **පෙරහැරේ අනුපිළිවෙල:-**

1. කස කරුවෝ හා ගිනි බෝලකරුවෝ
2. මහ බඹා රැගෙන යාම (මහ බඹා කෝලම)(මහ බඹා කෝලම පෙරහැරේ මුලින්ම ගමන් කරවීමෙන්,සිදුවන සියලු විපත් දුරු වන බවට විශ්වාසයක් ජනතාව තුළ ගොඩ නැගී ඇත.)
3. පෙරමුණේ රාල හා හේවිසි වාදකයෝ,නර්තන ශිල්පීන්හු,අලි ඇතුන් සහිත දළදා කරඬුව රැගත් හස්තිරාජයා ඊට පිටුපසින් ගමන් කරති.
4. ඉන්පසු පත්තිනි පෙරහැරේ කාන්තාවෝ සුදු වස්ත්‍ර ඇඳ දෝලාව අසලින් ගමන් කරති.
5. සමන්දෙවි පෙරහැරේ සමන් දේව ආභරණ, දෝලාව හා කුමාර රථය ආදිය රැගෙන යනු ලැබේ.

- රන්දෝලි පෙරහර අවසාන දිනයට පසු දින, දහවල දිය කැපීමේ චාරිත්‍රය සිදු කරනු ලැබේ.
- පෙරහැරේ උත්සවය සම්පූර්ණයෙන්ම නිමා වන්නේ ගරායකුම නැටුමෙනි.

- **සමන් දේවාල ඇසල පෙරහර පිළිබඳ ඉහත සටහන උපයෝගී කරගනිමින් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. සබරගමු සමන් දේවාලය හා බැදි ඓතිහාසික කරුණු 5 ක් ලියන්න.
2. පෙරහරේ මූලික චාරිත්‍ර වර්ග 3ක් නම් කරන්න.
3. එම චාරිත්‍ර වර්ග 3ට අදාල චාරිත්‍ර විධි ලියන්න.
4. මෙම පෙරහරේ දැකිය හැකි නර්තනාංග සම්ප්‍රදායික නර්තන ආදී වශයෙන් වර්ග කර ලියන්න.
5. සමන් දේවාල පෙරහරේ දැකිය හැකි වාදන අංග මොනවාද?
6. සමන් දේවාල පෙරහරෙහි සමන්විත පෙරහර 5 ලියන්න.
7. සමන් දේවාල පෙරහර ගමන් කරන අනු පිළිවෙළ කෙටියෙන් ලියන්න.
8. මහබඹා කෝලම පෙරහරෙහි රැගෙන යාමෙන් අපේක්ෂා කරන්නේ කුමක්ද?
9. සමන් දේවාල පෙරහරෙහි විචිත්‍රත්වය වැඩි දියුණු කිරීම සඳහා යොදා ගනු ලබන වෙනත් විශේෂාංග මොනවාද?
10. සමන් දේවාල පෙරහර අවසාන කරන්නේ කෙසේද?

**පැවරුම:-**

- සමන් දේවාල පෙරහැර පිළිබඳ කරුණු එක් රැස් කොට කුඩා පොත් පිංචක් නිර්මාණය කරන්න.

## “ගොප් කලා අංගයක් නිර්මාණ කරමු .”

- **පහතින් දැක්වෙන ගොප් කැටයම අධ්‍යනය කරමින් පහත දැක්වෙන ක්‍රියාකාරකම කරන්න.**



1. ගොප් කොළ උපයෝගී කරගෙන රූං පෙත්තක්,ගොප් කොළ නලාවක්,මලක් නිර්මාණය කරන්න .
2. ගොප් සැරසිලි දක්නට ලැබෙන අවස්ථා නම් කරන්න .
3. ඔබ දැක ඇති ගොප් සැරසිල්ලක් සකස් කිරීම සඳහා යොදා ගෙන ඇති අමු ද්‍රව්‍ය නම් කරන්න .









රූං පෙත්තක් සෑදීම

## “නත්තල් උත්සවය පිළිබඳව විස්තර ඉදිරිපත් කරමු .”

- **දී ඇති පින්තූරය හා වචන උපයෝගී කරගනිමින් හිස් තැන් පුරවන්න**

1. නත්තල යන වචනයේ අරුත වනුයේ ................යන්නයි.
2. ආගමික වත් පිළිවෙත් ලෙස ...............................හා...................................දැක්විය හැකිය.
3. නත්තල් උත්සවය පැවැත්වීමේ අරමුණු ලෙස;
   1).................................................................................................................
   2)..................................................................................................................සඳහන් කල හැකිය.
4. නත්තල් උත්සවය හා බැඳි ගුණ දර්ම දෙකක් ලියන්න.
   1).....................................................................................................................
   2).....................................................................................................................
5. නත්තල් උත්සවය පිළිබඳව දැක්වෙන ගීතයක කොටසක් ලියන්න.

| **ජේසුතුමන් පැසසීම,ක්‍රිස්තුස් වහන්සේගේ උපත,වන්දමාන කිරීම,උපත,කළගුණ සැලකීම,සාමය,එකමුතුකම** |
|---|



**පැවරුම:-**

- නත්තල් කාඩ්පතක් හා ගව ලෙනක් නිර්මාණය කර එහි සටහනක් ඔබේ ගුරුතුමාට ලැබෙන්න සලස්වන්න.